# උත්ථාන සමයේ පස්වන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 14: 19–28

**"දෙවියන් වහන්සේ තමන් මඟින් ඉටු කළ සියල්ල ඔව්හු සභාවට දැන්වූහ."**

අන්තියෝකියෙන් ද ඉකොනියෙන් ද ජුදෙව්වරු අවුත් සමූහයක් පොළඹවා ගෙන, පාවුලුට ගල් ගසා, ඔහු මළහ යි සිතා නුවරින් පිටතට ඇද්දෝය. එහෙත් ගෝලයන් ඔහු අවට රැස්ව සිටි කල, ඔහු නැගිට නුවරට ඇතුළු වී, පසුදා බාර්ණබස් සමඟ දර්බයට ගියේ ය.
ඔව්හු ඒ නුවර සුබ අස්න දේශනා කොට, බොහෝ දෙනෙකු ගෝලයන් කර, ලුස්ත්‍රාවට ද ඉකෝනියට ද අන්තියෝකියට ද හැරී අවුත්, "අප බොහෝ දුක් විඳිමින් දෙවියන් වහන්සේගේ රාජ්‍යයට ඇතුළුවන්නට ඕනෑ ය" යි කියා ගෝලයන් ධෛර්යයවත්කර ඇදහිල්ලේ ස්ථිරව පවතින්නට ඔවුනට අවවාද කළහ. ඔව්හු එක එක සභාවේ සැදැහැවතුන් කෙරෙහි සභා මූලිකයන් පත් කොට, උපවාසයේ යෙදී යාච්ඥා කර, තමන් අදහාගත් ස්වාමින් වහන්සේට ඔවුන් භාර දී පිසිදිය මැදින් ගොස් පම්පිලියට පැමිණියහ.

ඔව්හු පර්ගායේ දී වචනය දේශනා කොට අත්තාලියට ගොස් එතැනින් නැව් නැගී අන්තියෝකියට පැමිණියහ. ඔවුන් ඉෂ්ඨ කළ සේවය නිසා දෙවියන් වහන්සේගේ වරප්‍රසාදයට ඔවුන් කල්මත්තෙන් භාර දෙන ලද්දේ මේ අන්තියෝකියේදී ය. එහි පැමිණි කල ඔව්හු සභාව රැස් කරවා දෙවියන් වහන්සේ තමන් ලවා ඉටු කළ සියල්ල ද විජාතීන්ට උන්වහන්සේ විශ්වාසය කරා දොරක් ඇර දුන් බව ද දැන්වූහ. තවද ඔව්හු ගෝලයන් සමඟ බොහෝ කලක් එහි නැවතී සිටියහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145 : 10–13, 21

පිළිතුර: ස්වාමිනි, අපි ඔබ වහන්සේගේ රාජ්‍යයේ මහිමය
ප්‍රකාශ කරමු.

ගීය:

සමිඳුනි, ඔබ මැවූ සියළු දේ ඔබට තුති පුදයි.
ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.

ඔව්හු ඔබවහන්සේගේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබවහන්සේගේ බල මහිමය ගැන ද කතා කරති.

එසේ කරන්නේ දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්,
රාජ්‍යයේ තේජෝ මහිමයත් මිනිසුන් හට දන්වනු පිණිසය.
ඔබවහන්සේගේ රාජ්‍යය සදාකාලික ය.

ඔබවහන්සේගේ ආධිපත්‍යය සියලු පරම්පරාවල ම පවත්නේය.
මා මුවින් සමිඳුන්ට පැසැසුම් ගී ගයන්නෙමි.
සව් සත සදා කල්හිම එතුමන්ගේ ශුද්ධ නාමයට ප්‍රශංසා කරත්වා.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
“මම යහපත් බැටළු එඬේරා වෙමි.
මම මාගේ බැටළුවන් අඳුනමි. ඔව්හු ද මා අඳුනති.”
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 14: 27–31

## “මාගේම සාමය ඔබට දෙමි”

“ශාන්තිය ඔබ වෙත ප්‍රදානය කර යමි. මාගේ ශාන්තිය ඔබට දෙමි. මා එය ඔබට දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. ඔබේ සිත් කැළඹෙන්නට වත් බිය වන්නට වත් ඉඩ නොදෙන්න. මම ගොස් නැවත ඔබ වෙතට එමි යි මා ඔබට කී බව ඔබ ඇසුවාහු ය. ඔබ මට ප්‍රේම කළාහු නම් මා පියාණන් වහන්සේ වෙතට යන බැවින් ඔබ ප්‍රීති වන්නහුය. මන්ද, පියාණන් වහන්සේ මට වඩා උතුම් ය. ඒ දේ සිදුවූ කල ඔබ විශ්වාස කරන පිණිස, එය සිදුවන්නට පෙර දැනට ම ඔබට කියා ඇත. තවදුරටත් ඔබ සමඟ කතාකිරීමට නුපුළුවන. ලෝකයේ අධිපතියා එන්නේය. මා කෙරෙහි කිසි බලපුළුවන්කාර කමක් ඔහුට නැත. එහෙත් මෙසේ වන්නේ මා පියාණන් වහන්සේට ප්‍රේම කරන බවත්. පියාණන් වහන්සේ මට අණ කළ ලෙස මා කරන බවත් ලෝකයා දැන ගන්නා පිණිස ය. නැගිට්න්න අපි මෙතැනින් පිටත්ව යමු” යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.